# පටිච්චසමුප්පාදය (අටවෙනි කොටස)
## 23.06.2019 - ශ්‍රී ලංකාරාමය
## නවසීලන්තය

අපි ඊයේ කිව්වා **නාමරූප පච්චයා සළායතනං** කියන කාරණාව. ඒ කියපු කාරණාවල් සමහර කෙනෙකුට වැටහිලා තිබුණා. සමහර කෙනෙකුට ඒ තරම්ම පැහැදිලි වෙලා නෑ. ඒකට හේතුවක් තිබෙනවා. ඒ හේතුවත් එක්ක මම අද ඉතිරිය කියලා දෙන්නම්.

අපි කිව්වා **විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියලා. මේ විඤ්ඤාණය කියලා කියන්නේ ප්‍රධාන වශයෙන්ම ප්‍රතිසන්ධි විඤ්ඤාණයට, ඊළඟට ප්‍රවෘත්ති විඤ්ඤාණයට.

ප්‍රතිසන්ධි විඤ්ඤාණය නිසා ඇති උනා **නාම** සහ **රූප. වේදනා සංඥා සංඛාර** කියන චෛතසික ධර්ම තමයි නාම හැටියට සලකන්නේ. සියල්ලම චෛතසික 52යි.

විඤ්ඤාණය පච්චයා
- නාමං = වේදනා (වේදනා චෛතසික) + සංඥා (සංඥා චෛතසිකය) + සංඛාර (චෛතසික 50)
- රූපං

මේ වේදනා - සංඥා - සංඛාර ටික පහළ උනේ විඤ්ඤාණය නිසා. ඒක නිසා අපිට කියන්න පුළුවන් **විඤ්ඤාණ පච්චයා නාමං - විඤ්ඤාණ පච්චයා රූපං** කියලා. දෙකම ගත්තොත් **විඤ්ඤාණ පච්චයා නාම රූපං** කියලා ගන්න පුළුවන්.

මේක තව ටිකක් සරල කරලා ගත්තොත් කියන්න පුළුවන්

- **විඤ්ඤාණ පච්චයා වේදනා**
- **විඤ්ඤාණ පච්චයා සංඥා**
- **විඤ්ඤාණ පච්චයා සංඛාරා** කියලා.

නමුත් අපි එහෙම වෙන වෙනම කියන්නේ නැතුව **වේදනා සංඥා සංඛාර** තුනම එකට අරගෙන **විඤ්ඤාණ පච්චයා නාමං** කියලා කියනවා.

ඊළඟට **විඤ්ඤාණ පච්චයා රූපං** කියන තැනදි අපිට පහත සඳහන් අයුරින් කියන්න පුළුවන්.

විඤ්ඤාණ පච්චයා පඨවි රූපං - විඤ්ඤාණ පච්චයා ආපෝ රූපං - විඤ්ඤාණ පච්චයා තේජෝ රූපං - විඤ්ඤාණ පච්චයා වායෝ රූපං - විඤ්ඤාණ පච්චයා චක්ඛු ප්‍රසාද රූපං - විඤ්ඤාණ පච්චයා සෝත ප්‍රසාද රූපං - විඤ්ඤාණ පච්චයා ඝාණ ප්‍රසාද රූපං - විඤ්ඤාණ පච්චයා ජිව්හා ප්‍රසාද රූපං - විඤ්ඤාණ පච්චයා කාය ප්‍රසාද රූපං - විඤ්ඤාණ පච්චයා වත්ථු රූපං - විඤ්ඤාණ පච්චයා ජීවිත ඉන්ද්‍රිය රූපං - විඤ්ඤාණ පච්චයා ඉත්ථි භාව රූපං - විඤ්ඤාණ පච්චයා පුරුෂ භාව රූපං කියලා මේ විදියට කියන්න පුළුවන්. නමුත් මෙහෙම

වෙන වෙනම කියන්න ගියහම ගොඩක් රූප තිබෙන නිසා ඔක්කොම රූප එකට අරගෙන කියනවා **විඤ්ඤාණ පච්චයා රූපං** කියලා.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස එදා රූප කියලා කිව්වේ කාය දසකය - භාව දසකය - වත්ථු දසකය කියලා නේද?

පිළිතුර - ඔව්, මෙහෙමයි ඒක තිබෙන්නේ. අපි හිතමු අපි මුකුත්ම දන්නේ නැති බොහොම ලා බාල ළදරු පිරිසක් කියලා. ඉතින් අපිට තේරෙන්නේ නැති නිසා **විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියලා පොදුවේ තිබෙන එක අපි ධර්ම ගෞරවයත් බුද්ධ ගෞරවයත් තබාගෙන ඒක වෙන වෙනම කොටස් වලට කඩලා **විඤ්ඤාණ පච්චයා නාමං - විඤ්ඤාණ පච්චයා රූපං** කියලා ගන්නවා.

ඊට පස්සේ **විඤ්ඤාණ පච්චයා නාමං** කියන එක **විඤ්ඤාණ පච්චයා වේදනා නාමං - විඤ්ඤාණ පච්චයා සංඥා නාමං - විඤ්ඤාණ පච්චයා සංඛාර නාමං** කියලා කියනවා. එහෙම ගන්න එකත් හරි. ඒකෙ වැරැද්දක් නෑ.

ඊට පස්සේ **රූපයට** ආවහම **කාය දසකය - භාව දසකය - වත්ථු දසකය** කියන තුනම ගන්න පුළුවන්.

**විඤ්ඤාණ පච්චයා රූපං**

| **කාය දසකය** | **භාව දසකය** | **වත්ථු දසකය** |
|---|---|---|
| 1. පඨවි | 1. පඨවි | 1. පඨවි |
| 2.ආපෝ | 2. ආපෝ | 2. ආපෝ |
| 3.තේජෝ | 3. තේජෝ | 3. තේජෝ |
| 4.වායෝ | 4. වායෝ | 4. වායෝ |
| 5.වර්ණ | 5. වර්ණ | 5. වර්ණ |
| 6.ගන්ධ | 6. ගන්ධ | 6. ගන්ධ |
| 7.රස | 7. රස | 7.රස |
| 8.ඕජා | 8. ඕජා | 8.ඕජා |
| 9.ජීවිත ඉන්ද්‍රිය | 9.ජීවිත ඉන්ද්‍රිය | 9.ජීවිත ඉන්ද්‍රිය |
| 10.කාය ප්‍රසාදය | 10. භාව රූපය | 10. වත්ථු රූපය |

අපිට **විඤ්ඤාණ පච්චයා** කාය ප්‍රසාද රූපං - **විඤ්ඤාණ පච්චයා** භාව ප්‍රසාද **රූපං -** **විඤ්ඤාණ පච්චයා** **වත්ථු ප්‍රසාද රූපං** කියලත් කියන්න පුළුවන්.

එහෙමත් නැත්නම් කියන්න පුළුවන් **විඤ්ඤාණ පච්චයා** කාය දසකං **- විඤ්ඤාණ පච්චයා** භාව දසකං **- විඤ්ඤාණ පච්චයා** වත්ථු දසකං කියලා. ඒකට හේතුව තමයි මේ හැම නමකින්ම නියෝජනය වෙන්නේ රූප නිසා.

ඒවගේම **විඤ්ඤාණ පච්චයා පඨවි රූපං, විඤ්ඤාණ පච්චයා ආපෝ රූපං** කියලා ඉතිරි සෑම රූපයකට වෙන වෙනම කියන්න පුළුවන්. නමුත් එහෙම කියන්න ගියහම ගොඩක් රූප තිබෙන නිසා අපි ඒ සියල්ල එකට කරලා **විඤ්ඤාණ පච්චයා රූපං** කියලා කියනවා. නමුත් අපි තේරුම් ගන්න ඕනෑ මේ **'රූපං'** කියන එක යටතේ compact එකක් තිබෙන්නේ කියලා. ඒ කියන්නේ ඔක්කොම රූප සම්පිණ්ඩනය කරලා තිබෙන්නේ. ඒක දිග හැරලා තෙරුම් ගන්න අපි දැන ගන්න ඕනෑ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එතකොට චක්ඛු ප්‍රසාද රූප?

<u>පිළිතුර</u> - ඒවා පහළ වෙන්නේ ප්‍රතිසන්ධි අවස්ථාවෙන් පස්සේ. එතකොට කියන්න පුළුවන් **විඤ්ඤාණ පච්චයා චක්ඛු ප්‍රසාද රූපං - විඤ්ඤාණ පච්චයා සොත ප්‍රසාද රූපං - විඤ්ඤාණ පච්චයා ඝාණ ප්‍රසාද රූපං - විඤ්ඤාණ පච්චයා ජිව්හා ප්‍රසාද රූපං** කියලා.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස රූප 28 න් මහා භූත හැර ඉතුරු රූප උපාදාය රූපද?

<u>පිළිතුර</u> - ඔව් ඉතුරු 24 උපාදාය රූප. ඒවා උපාදාය උනාට ඒ උපාදාය රූප තැන් තැන් වල ගොනුවෙලා තිබෙන්නේ ඒ තැනට ගැලපෙන්න.

**විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියලා කියපු එක **විඤ්ඤාණ පච්චයා නාමං** කියලා පුංචියට පුංචියට කඩලා තේරුම් ගන්න අපි දැනගන්න ඕනෑ. **විඤ්ඤාණ පච්චයා රූපං** කියලා කිච්චහමත් තනි තනි රූප වශයෙන් කඩලා ගන්න අපි දැන ගන්න ඕනෑ. බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තිබෙන්නේ ඔක්කොම එකට. නමුත් විභංගය කියන පොතේ තිබෙනවා මේ **රූපං** කියන්නේ මොකක්ද කියලා කඩලා පෙන්නලා.

**විඤ්ඤාණ පච්චයා නාමරූපං** වලට පස්සේ තිබනවා **නාමරූප පච්චයා සළායතනං.**


නාම = වේදනා (1) සංඥා (1) සංඛාර (50)

රූප = 28 ( මෙතැනදී විශේෂයෙන් ගන්නේ ප්‍රසාද රූප)

මේ නාම ටිකයි රූප ටිකයි නිසා හැදෙනවා සළායතන.

**සළායතන** = චක්ඛු ආයතනය + සෝත ආයතනය + ඝාණ ආයතනය + ජිව්හා ආයතනය + කාය ආයතනය + මනායතනය

**නාම රූප පච්චයා සළායතනං** කියලා කියන්නේ මේ හයටයි.




මේ සළායතන කියන තැන තිබෙන්නෙත් ඔක්කොම එකට දාල. එතකොට අපිට තිබෙන්න ඕනෑ හොඳ දැනුමක් හැකියාවක් වැටහීමක් **නාමරූප පච්චයා සළායතනං** කියලා කියනකොට **චක්ඛු - සෝත - ඝාණ - ජිව්හා - කාය - මන** කියලා ආයතන 6 බෙදලා වෙන් කරලා ගන්න. ඒ කියන්නේ **නාම රූප පච්චයා චක්ඛායතනං - නාම රූප පච්චයා සෝතායතනං - නාම රූප පච්චයා ඝාණායතනං - නාම රූප පච්චයා ජිව්හායතනං - නාම රූප පච්චයා කායායතනං - නාම රූප පච්චයා මනායතනං** වශයෙන් බෙදලා වෙන්කරලා ගන්න. නමුත් ඔක්කොම තිබෙන්නේ **නාම රූප පච්චයා සළායතනං** කියලා. ඒක බුදුරජාණන්වහන්සේ සාමූහික වශයෙන් කරපු දේශනාවක්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස **විඤ්ඤාණ පච්චයා නාම රූපං** කියලා කියන තැන රූප ගොඩේ චක්ඛු සෝත ඝාණ කියලා දාල ඊට පස්සේ ඒ set එකම නාම රූප එකතු වෙලා සළායතන වෙනවා කියලා කිව්වා. එතකොට දෙපැත්තේම රූප තිබෙනවා. ඒක පොඩ්ඩක් පැටලිලි සහගත උනා.

<u>පිළිතුර</u> - ඔව් ඔය ප්‍රශ්නය දැනුත් එනවා. දැන් බලන්න. **විඤ්ඤාණපච්චයා නාමං** කියලා **විඤ්ඤාණපච්චයා රූපං** කියන තැන තිබෙන්නෙත් ඔය රූප ටිකමයි.

ඊට පස්සේ **නාමරූප පච්චයා සළායතනං** කියන තැන නැවතත් තිබෙනවා නාම සහ රූප.



සළායතන කියන තැන චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය කියන්නේ **'රූප'**. 'මන' කියන්නේ **නාම**. නමුත් මෙතැනදී නාම කියලා කියන්නේ නැතුව රූප කියලා කියන්නේ නැතුව ආයතන කථාවෙන් නැවතත් ඒ ටික ඔක්කොම ඇවිල්ලා තිබෙනවා.

**විඤ්ඤාණ පච්චයා නාම රූපං** කියන තැන නාම ධර්ම ටිකයි රූප ධර්ම ටිකයි කියනවා. නැවතත් **නාමරූප පච්චයා සළායතනං** කියන තැනත් කියන්නේ 'රූපයි' 'නාමයි'. ඇයි එහෙම වෙන්නේ කියන එක අපි තේරුම් ගන්න ඕනෑ. පටිච්චසමුප්පාදය අමාරු ඔන්න ඕක නිසයි. මේක අපිට පටලැවුම් සහගත උනාට ධර්මයට ඒක පටලැවිලා නෑ. මෙතැන තිබෙන්නේ, originally එකම ධර්ම set එක නමුත් වෙන නම් වලින් වෙන විදියකට.

දැන් මේක බලන්න. අඹ ගෙඩියක් නිසා අඹ ගහක් ඇතිවෙනවා.

අඹ ගෙඩියක් නිසා අඹ ගහක් හටගන්නවා →



← මේ අඹ ගසේ තිබෙනවා මුල්, කඳ, අතු, කොළ, මල් සහ ගෙඩි. ඒ සමූහයට තමයි ගස කියලා කියන්නේ.

අඹ ගෙඩියක් නිසා පහළ උනා අඹ ගසක්. ගහක් ඇති උනා කියලා කියන කොට අපි ගන්නේ ඒ ගහේ තිබෙන කොටස් ඔක්කොම එක සමූහයකට. ඒ ගස කියන තැන තිබෙනවා මුල්, කඳ, අතු, කොළ, මල් සහ ගෙඩි කියන සියලුම දේ.

එතකොට අපිට කියන්න පුළුවන්

අඹ ගෙඩිය නිසා මුල් පහළ උනා.
අඹ ගෙඩිය නිසා කඳක් පහළ උනා.
අඹ ගෙඩිය නිසා අතු හැදුනා.
අඹ ගෙඩිය නිසා කොළ හැදුනා.
අඹ ගෙඩිය නිසා මල් හැදුනා.
අඹ ගෙඩිය නිසා ගෙඩි හැදුනා කියලා.

නමුත් අඹ ගෙඩියක් නිසා ගහක් හැදුනා කිව්වහම මුල් - කඳ - අතු - කොළ - මල් - ගෙඩි කියන විස්තර ඔක්කෝම හැංගිලා යනවා. 'ගහ' කියන එක අස්සේ ඒ ඔක්කොම තිබෙනවා. අපි ඒවා ගලවන්නේ නෑ. අපි සාමාන්‍යයෙන් කියන්නේ අඹ ගෙඩියක් නිසා ගහක් හැදෙනවා


කියලා. නමුත් ගහ කියන එක විස්තර කරහම  අඹ ගෙඩියක් නිසා  මුල් හැදිලා තිබෙනවා. අඹ ගෙඩිය නිසා කඳ හැදිලා තිබෙනවා. අඹ ගෙඩිය නිසා අතු හැදිලා තිබෙනවා, කොළ හැදිලා තිබෙනවා, මල් හැදිලා තිබෙනවා, දළු හැදිලා තිබෙනවා, ගෙඩි හැදිලා තිබෙනවා.

ඒක නිසා අපිට කියන්න පුළුවන් ‘අඹ ගෙඩිය’ නිසා ‘අඹ ගෙඩි හැදුනා’ කියලා. එහෙම කිව්වොත් හරිද? වැරදිද? ඒක හරි. එතකොට මේ අඹ ගෙඩියට පුළුවන් ගෙඩි හදන්න, කඳ හදන්න, මල් හදන්න, ඒ ඔක්කොම හදන්න පුළුවන්.

**ඒවගේ විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියලා කිව්වහම විඤ්ඤාණය නිසා වේදනා හදනවා - විඤ්ඤාණය නිසා සංඥාව හදනවා - විඤ්ඤාණය නිසා සංඛාරය හදනවා - විඤ්ඤාණය නිසා රූප හදනවා - විඤ්ඤාණ නිසා පඨවි හදනවා - විඤ්ඤාණ නිසා ආපෝ හදනවා කියලා වෙන් වෙන් වශයෙන් කියන්න පුළුවන්.

නැවතත් ඒ වේදනා - සංඥා - සංඛාර යන නාම ධර්මත් - රූපත් නිසා ආයෙත් හැදෙනවා චක්ඛායතන - සෝතායතන - ඝාණායතන - ජිව්හායතන - කායායතන - මනායතන කියන සළායතන.

ඒක හරියට මුල් අඹගස නිසා හටගත් ගෙඩියෙන් නැවතත්, දෙවෙනි වරටත් අඹ ගහක් හදනවා වගෙයි. ඒ හැදෙන ගසෙත් මුල් තිබෙනවා කඳ තිබෙනවා, කොළ තිබෙනවා.




මෙතැන තිබෙනවා භාෂා දෙකක්. අඹ ගෙඩිය නිසා ගසක් හැදෙනවා කියනවා. එතකොට ගෙඩි - මල් - කොළ - කඳ - අතු - මුල් කියන විස්තර හැංගිලා යනවා.

ඒවගේම **විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියන තැන විඤ්ඤාණය නිසා නාම රූප හැදෙනවා. ඊළඟට ඒ නාම ධර්ම රූප ධර්ම නිසා හැදෙනවා චක්ඛු - සෝත - ඝාණ - ජිව්හා - කාය - මන කියන ආයතන හැදෙනවා.

ඊළඟට මෙහෙමත් හිතන්න. මේ white board එක මොකක් හරි company එකක හදලා තිබෙනවා. ඇයි මේ white board එක හැදුවේ? ලියන්න. ඊළඟට ඒ white board එකේ ලියන්න ගන්න විශේෂ පෑන් වර්ගයක් හදලා තිබෙනවා. එතකොට ඒ පෑන් වර්ගය වෙනම

හැදුනා. white board එක වෙනම හැදුනා. ඊළඟට ඒ දෙකම සම්බන්ධ කරගෙන අපි ලියපු අකුරු තිබෙනවා. මේ white board එකෙන් ඇත්තටම කරන්නේ උගන්වන එකක්. පෑනෙන් කරන්නෙත් ලියමින් උගන්වන එකක්. තනිකර board ඒකෙන් විතරක් උගන්වන්නත් බෑ. පෑනෙන් විතරක් තනියෙන් උගන්වන්නත් බෑ. ඒ දෙකේම සංකලනයක් වෙන්න ඕනෑ.

යම් කිසි වෙලාවක board එක හදනවානම් එතැන තිබෙන්නේ ඉගැන්වීමේ පරමාර්ථයමයි. ඒවගේම යම්කිසි තැනක් පෑන් හැදුවානම් එතැන තිබෙන්නේත් ඉගැන්වීමේ පරමාර්ථයමයි. ඒ ඉගැන්වීමේ පරමාර්ථය තිබුණත් පෑනත් white board එකත් වෙන වෙනම තිබෙන තාක්කල් ඉගැන්වීමක් වෙන්නේ නෑ. නමුත් උගන්වන්න පුළුවන් මූලික ධර්මය ඒවායේ තිබෙනවා. පෑනේ අකුරු නෑ. Board එකෙත් අකුරු නෑ. පෑනත් white board එකත් කියන්නේ අකුරු නැති ද්‍රව්‍ය දෙකක්. නමුත් යම්කිසි වෙලාවක board එක නිසාත් පෑන නිසාත් අකුරු හැදෙනවා. අකුරු හැදීමේ මූලික සාධකය පෑනේ තිබෙනවා. අකුරු හැදීමේ මූලික සාධකය board එකෙත් තිබෙනවා. නමුත් ඒ දෙක වෙන වෙනම තිබෙන තාක් කල් අකුරක් හැදෙන්නේ නෑ.

අපි මවුකුසේ ප්‍රතිසන්ධිය ලබලා සති කීපයක් ගියාට පස්සේ හැදෙනවා ඇසක්. ඇත්තට ඒ වේලාවේදීම අපිට ඇස පේනවද? ඒ වෙලාවේදී ඇස් පේන්නෙ නෑ. නමුත් පෙනීමේ හැකියාව තිබෙන්නාවූ ගුණය, චක්ඛු ප්‍රසාද ගතිය හැදෙනවා. ඒක හැදිලා එහෙම තිබෙනවා. නමුත් ඒ චක්ඛු ප්‍රසාද ගතිය හැදුනට ඒක ආයතන වැඩේ කරන්නේ නෑ. ආයතන වැඩේ කරන්නේ නැත්තේ ඒ චක්ඛු ප්‍රසාදය හැදුන ගමන්ම කෙලෙස් පහළ වෙන්නේ නෑ. ඒ චක්ඛු ප්‍රසාදය හැදුනගමන්ම ලෝභයක් හැදන්නෙත් නෑ. චක්ඛු විඤ්ඤාණය හැදෙන්නෙත් නෑ. වේදනාව හැදෙන්නේ නෑ. සංඥාව හැදෙන්නෙත් නෑ. මොකක්වත් හැදෙන්නේ නෑ. ප්‍රසාදය පමණයි තිබෙන්නේ. දැන් ඔය ප්‍රසාදය හැදිලා ඔහොම කාලයක් තිබෙනවා.

යම්කිසි දවසක මේ චක්ඛු ප්‍රසාදය ආලෝකයට නිරාවරණය වෙච්ච වේලාවක මොකක් හරි බාහිර දෙයක් චක්ඛු ප්‍රසාදයේ ගැටුනාද අන්න ඒ වේලාවේදී තමයි ප්‍රසාදය ආයතනයක් හැටියට වැඩ කරන්නේ. එතකොට තමයි වේදනාව සංඥාව විඤ්ඤාණය කියන ඔක්කොම ක්‍රියාත්මක වෙන්නේ. ඒ වෙලාවට තමයි චක්ඛු ප්‍රසාදය ආයතනයක් වෙන්නේ. ඒක හරියට පෑනත් board එකත් හැදිලා වෙන වෙනම තිබී කවුරුහරි අකුරු ලියන්න ඒවා පාවිච්චි කරපු වෙලාවට ඒ දෙකේම වටිනාකම එකතුවෙලා ක්‍රියාත්මක වෙනවා වගෙයි.

ඒ වගේ නාම ධර්ම ටිකයි රූප ධර්ම ටිකයි එකතුවෙලා තමයි චක්ඛු ප්‍රසාදය ආයතනයක් වෙන්නේ, ඒ වගේම ආයතන වැඩේ කරන්නේ, කෙලෙස් හදන්නේ, සිතුවිලි හදන්නේ, නාම ධර්ම බැස ගන්නේ ඒක ක්‍රියාත්මක වෙන වෙලාවටයි. අන්න එතකොට තමයි චක්ඛු ආයතනයක් වෙන්නේ. ඒ වෙලාවට ක්‍රියාත්මක වෙන්නෙත් රූපත් නාමත් තමයි, නමුත් ඒ නාම ධර්ම වලටයි රූප ධර්ම වලටයි ක්‍රියාත්මක වෙන්න base එකක් තිබෙන්න ඕනෑ.

ඊයේ මම මේ ගැන පාන් සම්බන්ධ කරලා කියලා දුන්නා. ඇත්ත වශයෙන්ම පාන් හැදෙන්නේ කුමක් නිසාද? පිටි නිසා. පාන් හැදෙන්න මූලික කාරණය තමයි පිටි. පිටි, පිටි විදියට තිබෙන තාක් කල් පාන් නෑ. පිටි ටික පාන් වෙන්න නම් යම්කිසි වෙලාවක අවශ්‍ය

දේවල් මිශ්‍ර වෙලා බේකරියක පෝරණුවක විකුර්තියට පත්වෙනකොට තමයි පාන් නමින් එන්නේ.

ඒ වගේම තමයි චක්ඛු ප්‍රසාදය තිබෙනවා. නමුත් ඒක ආයතනයක් වෙන්නේ නාම ධර්ම රූප ධර්ම ක්‍රියාත්මක වෙන වේලාවේදී. ඒක නිසා කියනවා '**නාම ධර්ම නිසා, රූප ධර්ම නිසා ආයතනයක් හැදෙනවා**' කියලා.

ප්‍රශ්නය - ස්වාමීන්වහන්ස කිව්වා රූප 28 ම ඔතන නෑ කියලා. විඤ්ඤාණපච්චයා රූපං කියලා කියන කොට අඩුවෙන රූප ටික මොනවාද?

පිළිතුර - අපි ක්‍රියාත්මක එකක් බලමු. එතකොට අඩුවෙන එක යයි.

දැන් බලන්න **නාමරූප පච්චයා චක්ඛායතනං** කියන තැන චක්ඛු විඤ්ඤාණය පහළ වෙනවා. මේ චක්ඛු විඤ්ඤාණය කියන තැන විඤ්ඤාණය කියලා කියන්නේ මනායතනයක්. ඒ විඤ්ඤාණය කියන එකට පහළ වෙන්න base එක වෙන්නේ චක්ඛු ප්‍රසාදය.

**චක්ඛු විඤ්ඤාණය** තනියම හටගන්නේ නෑ. ඒක ඇතුලේ තිබෙනවා තව ධර්මතා 7ක්. ඒ තමයි ඵස්ස - වේදනා - සංඥා - චේතනා - ඒකග්ගතා - ජීවිතඉන්ද්‍රිය - මනසිකාරය. මේ චක්ඛු විඤ්ඤාණයට පහළ වෙන්න හේතු උනේ චක්ඛු ප්‍රසාදයයි. එතකොට චක්ඛු ප්‍රසාදය ආයතනයක් වෙනවා. චක්ඛු ආයතනයක් හැටියට පත්වෙන්නේ ඔය විදියයි. (මේ චක්ඛු විඤ්ඤාණ සිත විපාක සිතක්. මේක ගත්තේ උදාහරණයක් හැටියට).

තවත් එකක් තිබෙනවා. මේ චක්ඛු විඤ්ඤාණයට පහළ වෙන්න ප්‍රසාදය විතරක් තිබුණාට මදි. ඒකට ගොදුරුවෙන තව ධර්මයක් තිබෙනවා. ඒ තමයි වර්ණ රූපය. මේ වර්ණ රූපය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙන්න වර්ණ රූපයේ ගැටෙන්න වර්ණ රූපය පහළ වෙන්න චක්ඛු ප්‍රසාදය උදව්වක් වෙනවා. එතකොට පේනවා නේද චක්ඛු ප්‍රසාදය production පැත්තෙන් බේකරියක් වගේ වැඩ කරනවා කියලා.

ඉස්සෙල්ලාම තිබුණේ චක්ඛු ප්‍රසාදය. ඒ චක්ඛු ප්‍රසාදය තිබිලා ඒක ආයතනයක් බවට පත්වෙන්නේ එතැන නාම ධර්ම රූප ධර්ම ආයතනික වශයෙන් ක්‍රියාත්මක වෙන්න යන වෙලාවේ. එහෙම නැත්නම් ඒක මූලික ගුණය දරාගෙන ප්‍රසාදයක් හැටියට තිබෙනවා.

තවත් එකක් තිබෙනවා. අපිට උපදින වෙලාවේ පහළ උනේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය. ප්‍රතිසන්ධි විඤ්ඤාණය පහළ වෙනකොට අපිට මොන ආයතනය පහළ උනා කියලද කියන්නේ? මනායතනය පහළ උනා කියලා කියන්නේ. නමුත් මනායතනය ගැන කියන්නේ ආයතන විස්තර කරන තැන.

ප්‍රතිසන්ධි අවස්ථාවේ කාය ප්‍රසාදය පහළ වෙනවා. නමුත් ඒ කය ලොකු වෙලා ලොකු වෙලා වැඩිලා ඉස්සරහදි සංවේදී ගතිය විස්තාරණය වෙන්න ලොකුවට දැනෙන්න හේතුවෙන්නා

වූ යම් යම් පරිසරයක හැදෙන නිසා අපි කියනවා ඒ වෙලාවේ ආයතනත් මූලික වශයෙන් පහළ උනා කියලා. නමුත් ඒවා ක්‍රියාත්මක වෙන්නේ නෑ.

එක වෙලාවකට මේවා ආයතන වශයෙන් අරගෙන ආයතන පහළ උනා කියලා කියනවා. ප්‍රසාදය වශයෙන් අරගෙන ප්‍රසාදය පහළ උනා කියලා කියනවා.

මේ අනුසාරයෙන් දැන් ඇස ගැන බලමු. අපේ මේ ශරීරය පුංචියට කළල රූපයක් හැටියට පහළ වෙලා ඊට පස්සේ පොඩි dots හැදෙනවා. Dots හැදිලා යම්කිසි දවසක ප්‍රසාද පහළ වෙනවා. මේ අතර චක්ඛු ප්‍රසාදයත් පහළ වෙලා ඒ මූලික ගතිය පිහිටලා ප්‍රසාදයක් වශයෙන් තිබෙනවා. මේ චක්ඛු ප්‍රසාදය පහළ වෙච්ච තැන චක්ඛු ප්‍රසාදය පහළ උනා කියලා ඍජුව කියන්න පුළුවන්. නමුත් චක්ඛු ආයතනය පහළ උනා කියලා කියන්න පුළුවන්ද? ඇත්තටම එතැනදි ආයතනයක් වශයෙන් ක්‍රියාත්මක නොවුවත් චක්ඛු ආයතනය පහළ උනා කියලා කියනවා. නමුත් එතැන වෙන්නේ ඉස්සරහදි චක්ඛායතනය හැටියට ක්‍රියාත්මක වෙන්න මූලික සිද්ධාන්තය, මූලික කාරණය පහළ වීම. ආයතනයක් කියලා හොඳටම කියන්න පුළුවන්කම තිබෙන්නේ ඒක ක්‍රියාත්මක වෙනකොටයි.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එතැන කියනවා නේද ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො කියලා?

<u>පිළිතුර</u> - ඔව් එහෙම තිබෙනවා. උප්පත්ති ක්‍රම හතරක් තිබෙනවා. සත්වයෙක් උපදින ආකාර හතරක් තිබෙනවා. ඒ තමයි අණ්ඩජ ජලාබුජ සංසෙදජ ඕපපාතික. අණ්ඩජ සත්වයන්ගේ පහළ වීමේදී කාය රූපයයි වත්ථු රූපයයි භාව රූපය කියන ප්‍රසාද රූප තුන පහළ වෙනවා මූලික වශයෙන්. පස්සේ තමයි ඇස් කන් නාසය ආදී දේවල් දියුණු වෙන්නේ. බිත්තරයක ඉපදෙන්නා වූ කුකුල් පැටියාගේත් ඉස්සරවෙලා පහළ වෙන්නේ කාය භාව සහ වත්ථු. ඊට පස්සේ එයා ලොකුවෙලා එනකොට තමයි ඇස් කන් නාස ආදීය හැදෙන්නේ.

ජලාබුජ සත්වයෝ කියලා කියන මනුස්සයෝ ආදී සත්වයෝ පහළ වෙනකොටත් කාය රූපයයි වත්ථු රූපයයි භාව රූපය කියන ප්‍රසාද රූප ටික පහළ වෙනවා මූලික වශයෙන්. පස්සේ තමයි develop වෙලා එනකොට චක්ඛු සෝත ඝාණ ජිව්හා කියන ඉන්ද්‍රිය පහළ වෙන්නේ.

නමුත් සංසෙදජ සහ ඕපපාතික සත්වයන්ගේ තිබෙනවා ඒ ගොල්ලෝ පහළ වෙනකොටම ඇස් කන් නාස ආදී ඔක්කෝම පහළ වෙනවා. ඒක නිසා ඔය ජාතිය ගැන කියන අවස්ථාවේදී **තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො** කියලා ස්කධයන්ගේ පහළ වීම ආයතනයනගේ ප්‍රතිලාභය ආදිය වෙනවා කියලා කියනවා. දෙවියෝ හැටියට උපදිනකොට ඒ දෙවියන්ගේ ශරීරයේ චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය භාව ආදී ඔක්කොම ආයතන පහළ වෙනවා.

මේ **විඤ්ඤාණ පච්චයා නාමරූපං** කියන එකයි **නාමරූප පච්චයා සළායතනං** කියන එකයි හොඳට තේරුම් ගන්න ඕනෑ. විඤ්ඤාණ පච්චයා නාමරූපං - නාමරූප පච්චයා සළායතනං - සළායතන පච්චයා ඵස්සො කියලා බොහෝ දෙනෙකුට කියන්න පුළුවන්. නමුත් ඒකෙ ක්‍රියාකාරී ස්වභාවය, ඒක වෙන්නේ කොහොමද කියන එක තමයි හරි පරෙස්සමෙන් තේරුම් ගන්න ඕනෑ. හේතුව, එකම ධර්ම ටිකක් තමයි දෙපොළක තුන්පොළක කියවන්නේ.

හොඳයි සැම දෙනාටම ධර්ම අවබෝධය නිර්වාණ අවබෝධය සුවසේම සිද්ධ වේවා කියලා මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා.

සාධු! සාධු! සාධු!



ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.